සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතිය
அகில இலங்கை தறைமுக சேவை ஊழியர் பொது ஒள்றியம்
All Ceylon General Ports Employee Union

අංක 10, නගර සභා පටුමග, දෙහිවල.
இல 10, நகரசபை ஒழுங்கை, தெஹிவளை
No 10, Council Lane, Dehiwala
Tel: 011 2720218 Fax: 011 2720229

ලියාපදිංචි අංකය:
பதிவு இலக்கம்: 6287
Registration No:

සලවපොසේස/2023/02

2023.09.01

බුද්ධ සාසන, සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ ගරු අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමා,
බුද්ධ සාසන, සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය,
හතරවන මහළ,
සෙත්සිරිපාය, බත්තරමුල්ල

ගරු ඇමතිතුමනි,

<u>කොළඹ වරාය අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පුරාවිද්‍යා හානී ඇගයීම් වාර්තාවක් පවා ලබා නොගෙන කොළඹ වරාය තුළ පිහිටි ලංදේසි යුගයට අයත් පෞරාණික ගොඩනැගිල්ලක් කඩා ඉවත් කිරීමට විරෝධය පළකිරීම.</u>

01 ඉහත කරුණ සම්බන්දයෙන් යතෝක්ත අප සමිතිය විසින් සලවපොසේස/2022/01 හා 2022.10.11 දිනැතිව පුරාවිද්‍යා අධ්‍යක්ෂක ජනරාල් තුමාවද, නැවත සලවපොසේස/2023/01 හා 2023.06.02 දිනැතිව ඔබතුමාවද, ඊටත් අමතරව සලවපොසේස/2023/01 හා 2023.07.26 දිනැතිව නැවත පුරාවිද්‍යා අධ්‍යක්ෂක ජනරාල් තුමියවද විටින් විට දැනුවත් කරමින් හා යෝජනා ඉදිරිපත් කරමින් පුරාවිද්‍යා වටිනාකමක් සහිත ඉහත කී ගොඩනැගිල්ල ආරක්ෂා කර ගැනීම සඳහා මහත් පරිශ්‍රමයක් දරන ලද බව ඔබතුමාද ඉතා හොදින් දනිතැයි අප සිතමු.

02 හුදෙක් අප එම උත්සහය ගනු ලැබුවේ මෙම පෞරාණික ගොඩනැගිල්ල පිහිටි භූමිය පුරාවිද්‍යා, ස්මාරක රැසක් පිහිටි ස්ථානය පිහිටා තිබීමත්, සංචාරක කර්මාන්තයේදී විශේෂයෙන් යුරෝපීය සංචාරකයින් සඳහා මෙම ස්ථානය විශේෂ අවධානයට ලක් කල හැකිව තිබූ ස්ථානයක් ලෙස අප හඳුනාගෙන තිබූ නිසාවෙනි.

03 පුරා විද්‍යා විෂය භාර අමාත්‍යවරයා ලෙස ඔබ ඉහත අර්ථයෙන් මෙම ගොඩනැගිල්ල ආරක්ෂා කර ගැනීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කර තිබූ සංවර්ධන සැලැස්ම වෙනස් කර ගැනීමට සාධනීය මැදිහත්වීමක් නොකල අතර පුරාවිද්‍යා ස්ථාන ඩෝසර් කරමින් සිදුකර උන්මත්තක සංවර්ධන සැලසුම් වල ගොදුරක් බවට ඔබතුමාද පත්ව තිබීම ඉතාම කණගාටුවට කරුණකි.

04 අප නියෝජනය කරන විෂයපථයට පුරවිද්‍යා කටයුතු අදාල නැතත් සමාජ වගකීමක් සේ සලකා මෙම ගොඩනැගිල්ල ආරක්ෂා කර ගනිමින් අධිවේගී මාර්ගය ඉදිකිරීමට අදාලව නව සැලසුමක් පසුගිය ජුලි 26 වන දින ඔබ යටතේ වගකීම් දරණ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් තුමියගේ අවධානයට අප යොමු කරනු ලැබුවද ඒ පිළිඹඳව කිසිදු තැකීමක් සිදුනොකර පුරාවිද්‍යා දේපළ ආරක්ෂා කිරීමට සිටින ඔබ අමාත්‍යාංශය හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වසර 350 ට වඩා පැරණි

ලංදේසි යුගයේ සිරකඳවුරක් ලෙස පවත්වාගෙන ගොස් ඇති දිගන් අඩි 217 ක් හා පළලින් අඩි 93 න් යුතු එමෙන්ම බිත්තියක පළල අඩි 7 ½ ක් පමණ වූ මෙම ගොඩනැගිල්ල කඩා දැමීම සඳහා පසුගිය අගෝස්තු 15 වන දින පුරාවිද්‍යා අධ්‍යක්ෂක ජෙනරාල්තුමිය විසින් මාර්ග සංවර්ධන අධිකාරියට අනුමැතිය ලබා දී ඇත.

05 පුරාවිද්‍යා අනපනත් අමු අමුවේ උල්ලංඝනය කරමින්, පුරාවිද්‍යා ස්ථාන විනාශ කරමින් සිදුකරන උන්මත්තක හා වල් බූරු සංවර්ධනයට කවුරු එකඟ වුවත් අප එකඟ නැත. ඔබ යටතේ ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉහළ නිළධාරීන්ට පුරාවිද්‍යා අනපනත් වලින් පැවරී ඇති වගකීම් දේශපාලන බලපෑම් වලට යට නොවී ඉටු කිරීමට තරම් කොදුනාරටියක් නොතිබුනත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ රාජකාරී කරන මැද මට්ටමේ නිළධාරීන් පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කර ගැනීමට දක්වන උනන්දුව හා කැපවීම පිළිබඳව අපගේ ගෞරවය ඔවුන්ට පිරිනමමු.

සංචාරක කර්මාන්තය දියුණු කිරීම වෙනුවෙන් යොදාගත හැකිව තිබූ පුරාවිද්‍යා වටිනාකමකින් යුතු මෙම ගොඩනැගිල්ල කඩා දැමීමට අදාල අනුමැතිය පුරාවිද්‍යා අධ්‍යක්ෂක ජනරාල්තුමිය විසින් 2023.08.15 දින ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත ලිඛිතව ලබාදීම මත 2023.08.28 හා 29 දින දෙක තුල එම කටයුතු සිදුකරන බව ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා විසින් 2023.08.25 දින ලිඛිතව දන්වා ඇත. ඒ අනුව එම කටයුතු මේ වන විට සිදුකෙරෙමින් පවතී. එම ලිඛිත දැන්වීමට අනුව ගොඩනැගිල්ල කඩා දැමීම අධීක්ෂණය කිරීමට පුරාවිද්‍යා නිළධාරීන් යොමුකරන ලෙසද ඉල්ලා ඇත.

අපගේ දැනීමේ හා අවබෝධයේ හැටියට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඇත්තේ පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කිරීමට මිස ඒවා කඩා බිඳ දමන ආකාරය අධීක්ෂණය කිරීමට නොවේ. අප විසින් දිගින් දිගටම පෙන්වා දෙන ලද කරුණු කිසිවක් පිළිබඳව අවධානය යොමු නොකොට පුරාවිද්‍යා ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට ලබා දෙන ලද අනුමැතිය සම්බන්දයෙන් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්තුමියට අපගේ බලවත් විරෝධයත්, අප්‍රසාධයත් මෙහිදී පල කර සිටිමු. එසේම විෂය භාර අමාත්‍යවරයා ලෙස පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කර ගැනීමට ඔබ කිසිදු උනන්දුවක්, මැදිහත්වීමක් නොදැක්වීම සම්බන්දයෙන් ඔබටද අපගේ විරෝධයත්, අප්‍රසාධයත් මෙසේ පළකර සිටිමු.

ස්තුතියි,
මෙයට
Nimshan
නිරෝෂන් ගොරකානගේ
ප්‍රධාන ලේකම්

පිටපත් -
01 නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා - ගරු වරාය හා නාවික කටයුතු අමාත්‍ය
02 පුරාවිද්‍යා අධ්‍යක්ෂක ජනරාල්තුමිය - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
03 සියළු ජනමාධ්‍ය වෙත